**කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2026**

**කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය සුදුසුකම්.**

01) CIDA ආයතනයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන් රු.20,000,000/= (රුපියල් මිලියන දහය) දක්වා වන සුළු පරිමාණයේ කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි කර ගැනීමට සුදුසුකම් ලබයි. තවද ලියාපදිංචි සමිති 2,000,000/= (රුපියල් මිලියන දෙක) දක්වා වන කොන්ත්‍රාත් වැඩ කිරීමට සුදුසුකම් ලබයි.

02) සුදුසුකම් හා වත්කම් සනාථ කරන්නාවූ ලිඛිත සාක්ෂීන් ඉදිරිපත් කළ යුතුය. (ඒවායේ පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුයි.)

03) සිවිල් ඉංජිනේරු වැඩකටයුතු හසුරුවා ගැනීමේ සුදුසුකම් ස්ථිරකර ගෙන ඇතොත් එය සනාථ කිරීමට හැකි ලියකියවිලි ඉදිරිපත් කල යුතුයි. (ඒවායේ පිටපත් අයදුම්පත්‍රය සමඟ ඇමිණිය යුතුයි.)

04) ඉදිකිරීම් වැඩ සඳහා ලියාපදිංචි කර ගැනීමට අපේක්ෂිත කොන්ත්‍රාත්කරුවන් ආපසු ගෙවනු නොලබන තැන්පත් මුදල, ප්‍රාදේශිය ලේකම් කාර්යාලයක් වෙත ගොස් 2003-02-99 ආදායම් ශීර්ෂය වෙත මුදල් ගෙවීම මගින් හෝ **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- අම්පාර"** නමින් ඇති **7042024** අම්පාර ලංකා බැංකු ශාඛාවේ ඇති ගිණුමට බැර කිරීම මගින් සිදු කළ හැකි අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවන ලද කුවිතාන්සිය හෝ බැංකුවට ගෙවන ලද මුදල් තැන්පත් කුවිතාන්සි මුල් පිටපත අයදුම්පත සමඟ අමුණා **"දිස්ත්‍රික් ලේම් කාර්යාලය, අම්පාර"** යන ලිපිනයට **2025 දෙසැම්බර් 15 දිනට පෙර** ලැබීමට සැලැස්විය යුතුයි. ඉල්ලුම්පත්‍ර බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් රැගෙනවිත් ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

**අයදුම්පත්‍රය සහ ලියාපදිංචිය -** ලියාපදිංචි කිරීම සඳහා ආපසු ගෙවනු නොලබන පහත සඳහන් මුදල ඉහත සඳහන් ගිණුමට තැන්පත් කර පූර්ව සුදුසුකම් (Pre – Qualifications) සනාථ කිරීමේ ආකෘති පත්‍රය සමඟ එම කුවිතාන්සිය අමුණා එවිය යුතුය.

| **ශ්‍රේණිය** | **කොන්ත්‍රාත් මුදල** | **ගාස්තුව** |
|---|---|---|
| C9 | කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 04 හෝ ඊට අඩු වටිනාකම් සඳහා | රු.2,000/= |
| C8 | කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 10 හෝ මිලියන 10 අඩු වටිනාකම් සඳහා | රු.3,000/= |
| C7 | කොන්ත්‍රාත් මුදල රු.මිලියන 20 හෝ මිලියන 20 අඩු වටිනාකම් සඳහා | රු.5,000/= |
| C6 හෝ ඉහල | කොන්ත්‍රාත් මුදල රු.මිලියන 50 හෝ මිලියන 50 අඩු වටිනාකම් සඳහා | රු. 10,000/= |
| EM05 හෝ ඉහල | විදුලි හා යාන්ත්‍රික සේවා | රු.5,000/= |

**සාමාන්‍ය කොන්දේසි :-**

**සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය ලියකියවිලි.**

1) අයදුම්පත්‍රය සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුයි.

a. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත.

b. සමාගම් ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත.

c. ආහාර සැපයුම් සේවාවක් නම්, අදාළ ප්‍රදේශයේ PHI / MOH කාර්යාලයෙන් ලබාගත් සහතිකයේ පිටපත

d. අදාළ ව්‍යාපාර පිළිබඳ පළපුරුදු හා ප්‍රධාන පාරිභෝගිකයින් පිළිබඳ විස්තර.

e. වාහන අලුත්වැඩියා සහ සේවා සපයන ආයතන ලියාපදිංචි වීමේදී අම්පාර ප්‍රධාන මෝටර් රථ පරීක්ෂකගේ නිර්දේශය සහිත ලිපිය

2) මෙම සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම 2026 වර්ෂයට පමණක් වලංගුවේ. සාමාන්‍යයෙන් ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. නමුත් වෙනත් අයගෙන් ද මිල ගණන් කැඳවීමේ හිමිකම් මිලදී ගන්නා අයට ඇත.

3) අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති තොරතුරුවල යම් වරදක් තිබේ නම්, එවැනි අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4) ලබාගන්නා අයදුම්පත්‍රය හේතු සාධක ඉදිරිපත් කිරීමකින් තොරව පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ දිස්ත්‍රික් ලේකම්ට හිමිකම් ඇත.

5) ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් මිල ගණන් කැඳවන විට, එය නොසලකා හැරයහොත් හෝ වැඩ අවසන් නොකරන්නේ නම් හෝ ලබාදී ඇති අයදර්ශ හෝ කොන්දේසිවලට එකඟ නොවන්නේ නම් හෝ එවැනි සැපයුම්කරුවන්/ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් ඉදිරි අනාගතයේ දී මිල ගණන් කැඳවන විට සලකා බලනු නොලැබේ.

6) ව්‍යාපාර ලියාපදිංචි කර ඇති ස්වභාවය හෝ ඊට අදාළ භාණ්ඩ හා සේවා සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කරගත හැක.

7) ලියාපදිංචි සමිතිවලට රු.2,000,000/= (රුපියල් මිලියන දෙකක) උපරිමයට යටත් කොන්ත්‍රාත් වැඩ, 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.1.9 වගන්තිය අනුව අයදුම් කළ හැක.

8) වාහන පිරිසිදු කිරීමේ හා නඩත්තු සේවා සඳහා ලියාපදිංචි කරන සැපයුම්කරුවන්, අවශ්‍ය මූලික උපකරණ හා පහසුකම් සනාථ කිරීමේ විස්තර අයදුම්පත්‍රය සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුයි.

9) සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් කිසිවක් ගෙවනු ලැබේ.

05) කොන්ත්‍රාත් කරුවන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම්පත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලබා ගැනීම හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල වෙබ් පිටුවෙන් භාගත කිරීම කළ හැක. ආපසු ගෙවනු නොලබන තැන්පත් මුදල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් වෙත ගොස් **2003-02-99** ආදායම් ශීර්ෂය වෙත මුදල් ගෙවීම මගින් හෝ **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- අම්පාර"** නමින් ඇති අංක **7042024** දරන අම්පාර ලංකා බැංකු ශාඛාවේ ඇති ගිණුමට බැර කිරීම මගින් සිදු කළ හැකි අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවන ලද කුවිතාන්සිය හෝ බැංකුවට ගෙවන ලද මුදල් තැන්පත් කුවිතාන්සි මුල් පිටපත අයදුම්පත සමඟ අමුණා **"දිස්ත්‍රික් ලේම් කාර්යාලය, අම්පාර"** යන ලිපිනයට **2025 දෙසැම්බර් 15 දිනට පෙර** ලැබීමට සැලැස්විය යුතුයි. ඉල්ලුම්පත්‍ර බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කොට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් රැගෙනවිත් ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

10) ලියාපදිංචි වීමට කැමති සැපයුම්කරුවන් එක් එක් අයිතමය සඳහා වෙන වෙනම රු. **1,000/=** බැගින් වූ ආපසු ගෙවනු නොලබන මුදලක් **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -අම්පාර"** නමින් ඇති අංක **7042024 දරණ ගිණුමට** බැර කිරීම හෝ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් **2003-02-99** අදායම් ශීර්ෂයට බැර කර ලබාගන්නා කුවිතාන්සි මුල් පිටපත,අයදුම් පත සමඟ අමුණා ඉදිරිපත් කළ යුතුය.

11) 2025 දෙසැම්බර් 15 දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12) වැඩිදුර විස්තර සඳහා www.ampara.dist.gov.lk යන වෙබ් අඩවිය පිවිසීමෙන් හෝ **"දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- අම්පාර"** කාර්යාලයේ දුරකථන අංක 063-2224458 ට ඇමතීමෙන් හෝ ලබාගත හැක.